# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# Annual Performance Report

2015

**කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය**

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு

Ministry of Women and Child Affairs

# පටුන


හැඳින්වීම.......................................................................................................................... 03

දැක්ම , මෙහෙවර, ආයතන සංයුතිය............................................................................ 04

මූලික අපේක්ෂාවන්, ප්‍රධාන උපාය මාර්ග සංවර්ධන අරමුණු, කාර්ය සාධන දර්ශක..... 05-06

කාර්ය මණ්ඩල විස්තරය (2015.12.31) ..........................................................................06-08

ජාත්‍යන්තර දින සැමරුම් ............................................................................... 09

**ආංශීය කාර්ය සාධනය**

පාලන අංශය.......................................................................................................................... 10-11

ගිණුම් අංශය.......................................................................................................................... 12-14

අභ්‍යන්තර විගණන අංශය...............................................................................................14-16

සැලසුම් අංශය.......................................................................................................................16-17

සංවර්ධන අංශය...................................................................................................................18-22

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය...............................................................................................23-30

ජාතික කාන්තා කමිටුව..........................................................................................................31-34

ළමා ලේකම් කාර්යාලය.........................................................................................................35-42

*කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ*

*2015 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව*

*2002 සැප්තැම්බර් 12 දිනැති*

*රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි*

*උපදෙස් පරිදි පිළියෙල කර ඇත.*

# හැදින්වීම

ශ්‍රී ලාංකේය කාන්තා හා ළමා පරපුරේ උන්නතිය උදෙසා ශ්‍රී ලංකා ප්‍රාජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.09.21 දිනැති අංක 1933/13 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් පවරා දෙන ලද කාර්යයන්, ක්‍රියාවට නැංවීම උදෙසා අදාළ පරිදි අමාත්‍යාංශය වෙත සුවිශේෂී කාර්යයභාරයක් පැවරී ඇත.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය හා කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් පිටුදැකීම පිළිබඳ සම්මුතියේ සඳහන් කරුණු ඇතුළත්වූ කාන්තා ප්‍රඥප්තිය, පාදක කරගෙන ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නීති සම්පාදනය, ප්‍රතිපත්ති සකස් කිරීම, වැඩසටහන් මෙහෙයවීම යන කාර්යයන් අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන විසින් සාර්ථකව ක්‍රියාවට නංවා ඇත.

ළමුන් හා කාන්තාවන් සම්බන්ධ නීති, ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම, යටිතල පහසුකම් සංවර්ධනය, කාන්තා හා ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය සඳහා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාවට නැංවීම ඒවා පසු විපරම් කිරීම මෙන්ම අනාගත ප්‍රතිපත්ති සම්පාදනයට දායක කර ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීමත් ළමුන් හා කාන්තා සංවර්ධනයට දායක වන දත්ත පද්ධතිය සකස් කිරීමත් 2015 වසර තුළ ක්‍රියාත්මක වූ ප්‍රධාන කාර්යයන් විය.

තවද, 2015 ජනවාරි මස ඇරඹුණු දින 100 වැඩ සටහන යටතේ කාන්තාවන් හා ළමුන්ගේ උන්නතිය උදෙසා ක්‍රියාවට නැංවූ, සාධනීය පියවර අතරට ළමා මන්දපෝෂණය වැළැක්වීම සඳහා ගර්භනී හා කිරිදෙන මවුවරුන්ට පෝෂ්‍යදායී ආහාර මල්ලක් මාසිකව ලබා දීම විශේෂ වැඩ සටහනක් ලෙසට සාර්ථක ප්‍රගතියක් ලබා ඇත. මුල් ළමාවියේ දරුවන්ගේ රැකවරණය හා සංවර්ධනය සඳහා ලෝක බැංකු මූල්‍ය අනුග්‍රහය (ණය) යටතේ මුල් ළමාවිය සංවර්ධන විශේෂ ව්‍යාපෘතියක් ආරම්භකර ඇත.

2014 වර්ෂයේ ආරම්භකරන ලද ළමා කාන්තා සංවර්ධන ඒකක ශක්තිමත් කිරීම හා ළමා අපයෝජන හා කාන්තා හිංසන වැළැක්වීමේ වැඩ සටහන යටතේ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ හා කාන්තා රැකවරණ මධ්‍යස්ථාන ඉදිකිරීමේ කටයුතු මෙම වසරේ ද සිදු කර ඇත.වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන්ගේ ආර්ථික හා සමාජීය සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා ජාතික ලේකම් කාර්යාලයක් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇත.

රාජ්‍ය හා රාජ්‍ය නොවන හා පෞද්ගලික යන සියලු අංශවල සාමූහික දායකත්වයෙන් හා සම්බන්ධීකරණයෙන් ළමා අපයෝජන වැළැක්වීම සඳහා Angel's Network ක්‍රියාත්මක කිරීම,1929 ළමා උපකාරක දුරකථන සේවාව,1938 කාන්තා උපකාරක දුරකථන සේවාව ශක්තිමත් කිරීම මෙම වසරේ ද සාර්ථකව සිදු විය.


## දැක්ම

ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත වන්නා වූ අභිමානවත් දේශයක් කරා

## මෙහෙවර

අභිමානවත් දේශයක් වෙනුවෙන් සමාජ ආර්ථික බලගැන්වීම, සමාජ වටිනාකම් ප්‍රවර්ධනය සහ අදාළ සියලු පාර්ශවයන්ගේ උපාය මාර්ගික එකාබද්ධ සහභාගිත්ව ලබාගැනීම මඟින් ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යහපාලන භාවිතාවන් තහවුරු වන පරිදි අදාළ අවශ්‍යතා සම්පාදනය කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.

## ආයතනික සංයුතිය



## මූලික අපේක්ෂාවන්

- ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය උදෙසා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම.
- කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය උදෙසා ජාතික සැලැස්මක් සකස් කිරීම.
- ළමා හා කාන්තා සංවර්ධනය සඳහා යාන්ත්‍රණයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
- රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන, විදේශ ආයතන සහ පෞද්ගලික අංශ සම්බන්ධීකරණය කරමින් ළමා හා කාන්තා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ළමා හා කාන්තා ආරක්ෂණය සහ සංවර්ධනය සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශය සහ ඊට අයත් නියෝජිත ආයතන මඟින් සිදු කරනු ලැබූ ආරක්ෂණ සහ සංවර්ධන වැඩ සටහන් අධීක්ෂණය කිරීම.
- ළමුන් හා කාන්තාවන් සම්බන්ධව ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටින සියලුම ජාත්‍යන්තර සම්මුතීන් හා එකඟතාවයන් සඳහා නීති, ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය.
- ළමා අපයෝජනය පිටු දැකීමෙහිලා අවශ්‍ය නෛතික හා ජාතික ප්‍රතිපත්තීන්ගෙන් සැදි පරිසරයක් ස්ථාපිත කිරීම.

## උපාය මාර්ග සංවර්ධන අරමුණු

- ඉහළ ගුණාත්මක භාවයකින් යුතු මුල් ළමාවිය සංවර්ධන හා රැකවරණ සේවාවක් තහවුරු කිරීම.
- නිවාසගත ළමුන්ගේ සුබසාධනය උදෙසා අයිතිවාසිකම් තහවුරු කිරීම හා ඔවුන් සමාජගත කිරීම.
- ළමා අපයෝජන වැළැක්වීම හා අවම කිරීම.
- අනාරක්ෂිත කාන්තා පවුල් සංවර්ධනය.
- ළමුන්ගේ හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නීති හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම.
- ලංකාව බැඳී සිටින ජාත්‍යන්තර සම්මුතීන්ට ගැලපෙන දේශීය ළමා හා කාන්තා සංවර්ධන ක්‍රමෝපායන් ස්ථාපිත කිරීම.

## ප්‍රධාන කාර්ය සාධන දර්ශක

01. 2015 වන විට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සියලුම පෙර පාසල් හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන අවම ප්‍රමිතීන් සපුරා තිබීම.
02. 2015 වන විට ශ්‍රී ලංකාවේ ළමා නිවාසවලින් 90% ළමා මිතුරු පරිසරයකින් යුතු "A "ශ්‍රේණියේ නිවාස බවට පත් කිරීම.
03. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකක ශක්තිමත් කිරීම තුළින් ළමා අපයෝජනය වැළැක්වීම හා අවම කිරීම.
04. වැන්දඹු හා ගෘහමූලික කාන්තා පවුල්වලින් 50% කට නව ජීවනෝපාය සංවර්ධන අවස්ථා ඇති කිරීම.
05. ළමුන්ගේ හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නීති ප්‍රතිපත්තිමය මැදිහත්වීම ප්‍රවර්ධනය කිරීම.
06. ළමුන් හා කාන්තාවන් සම්බන්ධව ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටින සියලුම ජත්‍යාන්තර සම්මුතීන් හා එකඟතාවයන් සඳහා සම්පාදනය කර ඇති නීති, ප්‍රතිපත්ති හා වැඩ සටහන් සංඛ්‍යාව.

## කාර්ය මණ්ඩල විස්තරය (2015.12.31 දිනට)


| අනු අංකය | තනතුර | සේවය | ශ්‍රේණිය පන්තිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | ජ්‍යෙෂ්ඨ මට්ටම | | | | |
| **01.** | ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | ( විශේෂ) | 01 | 01 |
| **02.** | අතිරේක ලේකම් (පාලන හා මුදල්) | ශ්‍රී.ලං.ප.සේ | (විශේෂ) | 01 | 01 |
| **03.** | අතිරේක ලේකම් (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ | (විශේෂ) | 01 | 01 |
| **04.** | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | SL-1 | 01 | 01 |
| **05.** | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | SL-1 | 01 | 01 |
| **06.** | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | SL-1 | 01 | 01 |
| **07.** | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | SL-1 | 02 | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **08.** | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ | SL-1 | 01 | 01 |
| 09. | ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේ | SL-11/111 | 02 | 01 |
| 10. | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | SL-11/111 | 05 | 05 |
| 11. | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ | SL-11/111 | 02 | 04 |
| 12. | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | SL-1 11/111 | 02 | 02 |
| 13. | සහකාර අධ්‍යක්ෂ (ICT) | ශ්‍රී.ලං.තො.තා.සේ. | 1 පන්තිය 111 ශ්‍රේණිය | 01 | 0 |
| 14. | නීති නිලධාරි | දෙපාර්තමේන්තුගත | 11/111 | 03 | 01 |
| | **තෘතීක මට්ටම** | | | | |
| **15.** | පරිපාලන නිලධාරි | රාජ්‍යකළමනාකරණ සහකාර සේවය (අධිපන්තිය) | MN-07 | 01 | 0 |
| **16.** | පර්යේෂණ නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN-06 | 01 | 0 |
| **17.** | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | MN-06 | 02 | 01 |
| **18.** | උපදේශන නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN-05 | 13 | 10 |
| | **ද්වීතීක මට්ටම** | | | | |
| **19.** | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | - | 01 | - |
| **20.** | සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා | MN-04 | 24 | 23 |
| **21.** | වනිතා සංවර්ධන නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN-04 | 335 | 306 |
| **22.** | අයවැය සහකාර | ආශ්‍රිත සේවා | MN-04 | 01 | 01 |
| **23.** | සංවර්ධන නිලධාරි | සංවර්ධන නිලධාරි සේවය | MN-04 | 516 | 274 |
| **24.** | පුස්තකාලයාධිපති | පුස්තකාලයාධිපති සේවය | MN-03 | 01 | 0 |
| **25.** | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. ක.ස.සේ. (1,11,111) | MN-02 | 40 | 29 |
| **26.** | පුස්තකාල සහකාර | දෙපාර්තමේන්තුගත | MN-01 | 01 | 01 |
| **27.** | පිළිගැනීමේ නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN-01 | 01 | 01 |
| **28.** | සහන සොයුරි | දෙපාර්තමේන්තුගත | MN-01 | 134 | 125 |
| **29.** | නේවාසිකාගාර පාලිකා | දෙපාර්තමේන්තුගත | MN-01 | 02 | 01 |
| **30.** | නේවාසිකාගාර පාලිකා (සහකාර) | දෙපාර්තමේන්තුගත | MN-01 | 02 | 01 |
| **31.** | තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන ස. | තො.තා.හා ස.ස | MT-01 | 03 | 01 |
| **32.** | කැමරා ශිල්පි | තාවකාලික | MT-01 | 01 | 01 |
| **33.** | නිශ්චල ඡායාරූප ශිල්පි | තාවකාලික | MT-01 | 01 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **ප්‍රාථමික මට්ටම** | | | | |
| **34.** | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේ. | PL-03 | 30 | 26 |
| **35.** | කැමරා ශිල්පී සහායක | තාවකාලික | PL-01 | 01 | 01 |
| **36.** | කාර්යාල කාර්ය සහයක | කා.සේ.සේ | PL-01 | 28 | 26 |
| **37.** | උපදේශන සේවා කම්කරු | දෙපාර්තමේන්තුගත | PL-01 | 12 | 11 |
| **38.** | අරක්කැමි | දෙපාර්තමේන්තුගත | PL-01 | 02 | 0 |

**ළමා ලේකම් කාර්යාලය**

| | | | | | |
|---|---|---|---|---|---|
| **39.** | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | SL-1 1 | 01 | 01 |
| **40.** | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | SL-11/111 | 04 | 02 |
| **41.** | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ | | - | 02 |
| **42.** | මුල් ළමාවිය සංවර්ධන සහකාර | සං.නි.සේ | MN-04 | 373 | 334 |
| **43.** | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. ක.ස.සේ. (1,11,111) | MN-02 | 03 | 03 |
| **44.** | රියදුරු | ඒකාබද්ධ රි.සේ | විශේෂ | 02 | 02 |
| **45.** | කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ | විශේෂ | 03 | |



## ජාත්‍යන්තර දින සැමරුම්

### ජාත්‍යන්තර කාන්තා දිනය

තේමාව - "කාන්තාවන්ට යහපත් රටක්"

2015 ජාත්‍යන්තර කාන්තා දිනය මාර්තු 08 වන දින ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුර සල්ගාදු ක්‍රිඩාංගනයේදි පවත්වන ලදි. මෙම උත්සවයට සමගාමීව කාන්තා නිෂ්පාදන සඳහා අළෙවි පොළ අවස්ථා ඇති කිරීමට නිෂ්පාදන වෙළඳ ප්‍රදර්ශනයක් පවත්වන ලදි. තවද, විශේෂඥ වෛද්‍ය සායන, ජංගම සේවා, ලේ පරිත්‍යාග කිරීමේ කඳවුරක් හා වෘත්තීය මාර්ගෝපදේශ හා මුල්‍ය සේවා ලබා දීම් යන කාර්යයන් සිදු කරන ලදි.





### ලෝක ළමා දිනය

තේමාව- "ළමා මිතුරු පරිසරයක් -ලොව බබලන සොඳුරු දැයක්"

2015 වර්ෂයේ ලෝක ළමා දින ජාතික උත්සවය ළමා රාජ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධනය කළ අතර එය යාපනය වීරසිංහ ශාලාවේදී උත්සවශ්‍රීයෙන් පවත්වන ලදි. මෙම උත්සවයට සමගාමීව ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් දැනුවත් කිරීමේ වැඩ සටහන් හා රසවින්දන වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි. තවද, යාපනය ළමා උද්‍යානයේදී ළමයින් සඳහා වැඩ සටහන් පවත්වන ලදි.





### ජාත්‍යන්තර ගැහැණු දරුවාගේ දිනය

ඔක්තෝබර් 11 දිනට යෙදී ඇති මෙම ජාතික දිනය වෙනුවෙන් ප්‍රාදේශිය මට්ටමින් වැඩ සටහන් පවත්වන ලදි."පරිකල්පන" දීප ව්‍යාප්ත චිත්‍ර තරඟ හා නාට්‍ය හා විවාද තරඟ පාසල් හා ළමා සමාජ ළමුන් වෙනුවෙන් පවත්වා ඇත.

# ආංශීය කාර්ය සාධනය

## පාලන අංශය

### ප්‍රධාන කාර්යභාරය

01. අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සම්බන්ධ ආයතනික කටයුතු, සම්බන්ධීකරණය හා විනය කාර්යයන් පවත්වාගෙන යාම.
02. අමාත්‍යාංශයට අනුමත වූ තනතුරුවල ඇතිවන පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම.
03. අමාත්‍යාංශයේ ව්‍යාපෘති හා කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය නව තනතුරු මු.රෙ.71 ට අනුව ඇති කිරීමට කටයුතු කිරීම.
04. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 ට අනුව දෙපාර්තමේන්තු තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි / උසස් කිරීමේ පරිපාටි සංශෝධනයන් සකස් කර අනුමත කර ගැනීම හා උසස් කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම. නව තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි සකස් කර අනුමත කරවා ගැනීම.
05. අමාත්‍යාංශයට අයත් අංශ /ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම හා වෙනත් සම්බන්ධිත කාර්යයන් සිදු කිරීම. (අයවැය කාරකසභාව, ගිණුම් කාරක සභාව,පෙත්සම් කාරක සභාව,කල්තැබීමේ යෝජනා සම්බන්ධයෙන් කටයුතු )
06. අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
07. මහජන දුක්ගැනවිලි සම්බන්ධයෙන් ජනාධිපති කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
08. අමාත්‍ය කාර්යාලය හා රාජ්‍ය අමාත්‍ය කාර්යාලයට අයත් කාර්යය මණ්ඩලයේ ආයතනික කටයුතු සිදුකිරීම.
09. තැපැල අංශ වලට බෙදා හැරීම හා පිටතට යැවෙන ලිපි තැපැල් කිරීම.
10. සැපයුම් හා සේවා පවත්වාගෙන යාම (ආරක්ෂක, පිරිසිදු කිරීම්, විදුලි බිල්පත් , ජලබිල්පත්, පුවත්පත්, ප්‍රවාහන පහසුකම්, දුරකථන , දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර , දුම්රිය ගමන් බලපත්‍ර ,සංග්‍රහ කටයුතු, වාහන රක්ෂණය )
11. වාහන සංචිතය පවත්වාගෙන යාම, වාහන අපහරණය කිරීම , අලුත්වැඩියා කිරීම හා අලුත් වාහන මිලදී ගැනීම.
12. ගොඩනැගිලි හා උපකරණ නඩත්තු කටයුතු.
13. අත්තිකාරම් ණය, උත්සව අත්තිකාරම් , විශේෂ අත්තිකාරම් , ආපදා ණය , දේපල ණය හා අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ ආයතනික කටයුතු .
14. බියගම කාන්තා සෙවණ නේවාසිකාගාර කටයුතු.
15. අමාත්‍යාංශයීය කාර්යය මණ්ඩලය සඳහා ආයතන හා මූල්‍ය කටයුතු පිළිබඳව පුහුණු වැඩ සටහන් පැවැත්වීම.

## ➢ කාර්ය මණ්ඩල කටයුතු

2015.12.31 දිනට අමාත්‍යාංශය සඳහා අනුමත මුළු සේවක සංඛ්‍යාව 1559 කි.එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 356 කි. 2015 වසර තුළ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නවක නිලධරින් දෙදෙනෙකු ලබා ගැනීමට හැකි විය. ඊට අමතරව තොරතුරු තාක්ෂණ කටයුතුවල අත්‍යාවශ්‍යතාවය සැලකිල්ලට ගෙන තාවකාලිකව මාණ්ඩලික මට්ටමේ නිලධාරියකු සේවය සඳහා අනුයුක්ත කර ගැනීමටත් පර්යේෂණ නිලධාරී තනතුරක් සහ නීති නිලධාරී තනතුරු 02 ක් අනුමත කර ගැනීමටත් හැකි වූ අතර එම බඳවා ගැනීම් සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරයන්ගේ පෞද්ගලික ලිපිගොනු ක්‍රමවත්ව පවත්වාගෙනයාම හා යාවත්කාලීන කිරීම, එදිනෙදා නිවාඩු සම්බන්ධ රාජකාරී, වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරුවීම්, විශ්‍රාම ගැන්වීම් ආදී පරිපාලන කටයුතු නිසි පරිදි සිදු කර ඇත.එසේම අමාත්‍ය කාර්ය මණ්ඩලය හා රාජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයේ ද ආයතන හා පරිපාලන කටයුතු අදාළ පරිදි සිදු කර ඇත.

අමාත්‍යාංශයට අයත් සියලුම නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය, තාක්ෂණික හැකියාව සහ භාෂා ප්‍රවීණතාවය ඉහළ නැංවීම අරමුණු කරගෙන දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් අඛණ්ඩව යොමු කර ඇත.

ඒ අනුව රියදුරන් සඳහා වාහන නඩත්තුව පිළිබඳව යාන්ත්‍රික පුහුණු, ඵලදායිතා ක්‍රමවේදය පිළිබඳව පුහුණු කරුවන් පුහුණු කරවීම, MS Excel advanced analysis tools පුහුණුව ,වැඩ අධ්‍යයන හා ක්‍රම අධ්‍යයන වැඩ සටහන් හා නිලධාරීන්ගේ මානසික සංවර්ධනය උදෙසා ගී රස වින්දන වැඩ සටහන් ආදී වශයෙන් දේශීය පුහුණු කිරීම් සිදු කරන ලදි.

විධායක නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් විදේශ පුහුණු සඳහා යොමු කර ඇත.

## ➢ අනුබද්ධ ආයතනවල කටයුතු

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යන ආයතනවල පරිපාලන කටයුතු සම්බන්ධීකරණය හා මහපෙන්වීම සම්බන්ධයෙන් පාලන අංශය ක්‍රියා කර ඇත. උක්ත ආයතනවල රා.ප.ච 6/2006 අනුව බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය, කාර්ය මණ්ඩලයේ තනතුරු ඇති කිරීම, පත් කිරීම, උසස් කිරීම, කාර්ය මණ්ඩලයේ සේවා ගැටළු පිළිබඳව අමාත්‍යාංශයට ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධ කටයුතු නිසි පරිදි සිදු කර ඇත.එසේම මෙම ආයතනවල නිලධාරින්ගේ විදේශ සංචාර,ශිෂ්‍යත්ව,පුහුණු පාඨමාලා සඳහා අනුමැතිය ලබා දීම ද අදාළ පරිදි නිවාඩු ලබා දීම ද සිදු කර ඇත.

## ➢ ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු

කාර්යක්ෂම මහජන සේවයක් හා ප්‍රියමනාප කාර්යාල පරිශ්‍රයක් ඇති කිරීම සඳහා අමාත්‍යාංශය ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කරන ලදි. එසේම ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් පවත්වනු ලබන ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලියට ඉදිරිපත් වූ අතර ඉන් විශේෂ කුසලතා සහතිකයක් හිමිකර ගන්නා ලදි.

# ගිණුම් අංශය

## ප්‍රධාන කාර්යභාරය

මුදල් විෂය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සමඟ විධිමත් සම්බන්ධීකරණයක් ඇති කර ගනිමින් එම සැලසුම් ක්‍රියාත්මක කරවීමේ කටයුතු, ව්‍යාපෘති ද ඇතුළුව අමාත්‍යාංශයේ ගිණුම් හා ගෙවීම් කටයුතු සම්බන්ධව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම, අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තු අත්තිකාරම් "බී" ගිණුම ඇස්තමේන්තු හා පරිපූරක ඇස්තමේන්තු කාලීනව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම, අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු ව්‍යාපෘති හා ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික අයවැය හා පරිපූරක ඇස්තමේන්තු සකස් කිරීම් සම්බන්ධීකරණය, අමාත්‍යාංශය ඇතුළු ඒ යටතේ ඇති සියලුම ආයතනවල නිල බැංකු ගිණුම් විවෘත කිරිම මෙහෙයවීම වසා දැමීම සම්බන්ධ කටයුතු, අනුමත ඇස්තමේන්තු පදනම් කර ගෙන ක්‍රියාකාරී ප්‍රාග්ධන සැලැස්ම සැකසීම හා අක්මුදල් පුරෝකතන ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීම හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම, සමස්ථ අයවැය ප්‍රතිපාදන කළමනාකරණය කිරීම හා විවිධ ව්‍යාපෘති ඇතුළු අනෙකුත් ආයතන වෙත සැලසුම්ගතව අක්මුදල් නිදහස් කිරීම, විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් මූල්‍ය පාලනය, වාර්ෂික විසර්ජන ගිණුම, අත්තිකාරම් ගිණුම, තැන්පත් ගිණුම් හා ව්‍යාපෘතිවල අවසන් ගිණුම් ඉදිරිපත් කිරීම, අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති විසින් යොමු කරන විගණන විමසුම් සඳහා පිළිතුරු යැවීම, වාර්ෂික ගබඩා සමීක්ෂණ කටයුතු සිදු කිරීම.

## විසර්ජන ගිණුම 2015

ශීර්ෂය 120- කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 2015 වර්ෂය සඳහා වූ 2015 .12.10 දිනැති අංක 245/2015 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් ඩීජීඑස්ඒ 1 ආකෘතියේ සිට 10 ආකෘතියද, සටහන (i) සිට සටහන (iv) (අ) හා (ආ) දක්වා වූ තොරතුරු සාරාංශයකින් සමන්විතව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්ට, 2015 අංක 1 දරණ හා 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධිත ) පනත්වලින් සංශෝධිත 2014 අංක 47 දරන විසර්ජන පනත හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, 2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ඇතුලත් රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව විසර්ජන ගිණුම සකස්කර නියමිත දිනට ඉදිරිපත් කර ඇත.

## 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

| වැඩ සටහන් අංකය | වැඩ සටහනේ නම | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම් | ශුද්ධ වෙන් කිරීම් | මුළු වියදම |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. |
| | පුනරාවර්තන | | | | | |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 607,810,000 | 0 | -15,835,350 | 591,974,650 | 582,504,347 |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 3,273,500,000 | 500,000,000 | 14,217,540 | 3,787,717,540 | 3,135,120,054 |
| | උප එකතුව (පුනරාවර්තන) | 3,881,310,000 | 500,000,000 | -1,617,810 | 4,379,692,190 | 3,717,624,401 |
| | මූලධන | | | | | |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 82,200,000 | 0 | 0 | 82,200,000 | 68,020,981 |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 555,883,000 | 25,000,000 | 1,617,810 | 582,500,810 | 372,219,229 |
| | උප එකතුව (මූලධන) | 638,083,000 | 25,000,000 | 1,617,810 | 664,700,810 | 440,240,210 |
| | මුළු එකතුව | 4,519,393,000 | 525,000,000 | 0 | 5,044,393,000 | 4,157,864,611 |

## වියදම් මූල්‍යකරණය

| | | වැඩ සටහන 1 | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය |
| | | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 674,174,650 | 650,525,328 | 674,174,650 | 650,525,328 | 96 |
| | එකතුව | 674,174,650 | 650,525,328 | 674,174,650 | 650,525,328 | |

| | | වැඩ සටහන 2 | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය |
| | | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 4,138,585,350 | 3,466,647,721 | 4,138,585,350 | 3,466,647,721 | 84 |
| 13 | විදේශ ආධාර-ප්‍රධාන | 231,633,000 | 40,691,562 | 231,633,000 | 40,691,562 | 18 |
| | එකතුව | 4,370,218,350 | 3,507,339,283 | 4,370,218,350 | 3,507,339,283 | |

## රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී "ගිණුම

| විස්තරය | උපරිම වියදම් සීමාව රු. | අවම ලැබීම් සීමාව රු. | උපරිම හර ශේෂ සීමාව රු. |
|---|---|---|---|
| විසර්ජන පනත මඟින් බලය දෙනු ලැබූ සීමාවන් | 40,000,000.00 | 17,000,000.00 | 85,000,000.00 |

# අභ්‍යන්තර විගණන අංශය

## ප්‍රධාන කාර්යභාරය

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල මුදල් හා ආයතන කටයුතු විගණනය හා වාර්තා කිරීම.
- වැරදි හා වංචා වැළැක්වීම සඳහා අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වන පාලන ක්‍රම,සාර්ථක දැයි සොයා බැලීම හා ඒ පිළිබඳ නිරීක්ෂණ හා යෝජනා ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශයේ ගිණුම් හා වෙනත් වාර්තාවල විශ්වාසනීයත්වය විනිශ්චය කිරීම හා අමාත්‍යාංශයේ වත්කම් සියලුම ආකාරයේ අලාභහානි වලින් උපරිම වශයෙන් ආරක්ෂා කර ඇත්දැයි යන්න සොයා බැලීම හා වාර්තා කිරීම.
- අමාත්‍යාංශය යටතතේ ඇති අංශවල පහත සඳහන් කටයුතු සම්බන්ධව ප්‍රගති සමාලෝචනය කිරීම සඳහා මාස තුනකට (03) වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

    - වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචනය කිරීම හා දුර්වල කාර්ය සාධනයන් මගහරවා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ඉදිරිපත් කිරීම.
    - විගණකාධිපති විසින් නිකුත් කරන  විගණන විමසුම්/විගණන වාර්තා සඳහා පිළිතුරු සැපයීම.
    - වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳ ඉදිරිපත් කිරීම්
    - වාර්ෂික වාර්තා/කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
    - වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම පිළිබඳ විගණනය
    - සංවර්ධන හා අභ්‍යන්තර පරිපාලනය කටයුතු

- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු සිදුවීම ප්‍රමාදවීමට තුඩු දී ඇති ගැටළු විගණනය කිරීම හා වාර්තා කිරීම.

2015 වර්ෂයට  අදාළව කළමනාකරණ හා විගණන කමිටු ,පළමුවන කාර්තුවට 2015.04.08 දින ද, දෙවන කාර්තුවට 2015.06.22 දිනද, තුන්වන කාර්තුවට 2015.11.11 දිනද, සිව්වන කාර්තුවට 2015.12.29 දිනද පවත්වා ඇත.

## 2015 වර්ෂය තුළ සිදුකරන ලද විගණන විමසුම්

| | | |
|---|---|---|
| 01. | ගම්පහ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ගම්පහ වනිතා ශක්ති පදනමේ මුදල් ශේෂය තහවුරු කිරීම | 2015.01.08 |
| 02. | බියගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වනිතා ශක්ති පදනම් පරික්ෂා කිරීම | 2015.05.07 |
| 03. | CEDAW හා BEIJING +20 අන්තර්ජාතික සම්මුතීන් පිළිබඳ රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහනේ ප්‍රගතිය පිළිබඳ පරීක්ෂාව | 2015.05.21 |
| 04. | අභ්‍යන්තර විගණන පරික්ෂාව - බැංකු සැසඳුම් ප්‍රකාශ -2015 අප්‍රේල් | 2015.05.26 |
| 05. | අභ්‍යන්තර විගණන මූලික වාර්තාව 2015 | 2015.02.06 |
| 06. | වනිතා ශක්ති සුළු මූල්‍ය ශාඛා ප්‍රගතිය | 2015.04.09 |
| 07. | වනිතා ශක්ති සුළු මූල්‍ය ශඛා ප්‍රගතිය | 2015.04.09 |
| 08. | බියගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වනිතා ශක්ති පදනම් පරික්ෂා කිරීම | 2015.05.05 |
| 09. | අභ්‍යන්තර විගණන පරික්ෂාව -බැංකු සැසඳුම් ප්‍රකාශ 2015 අප්‍රේල් 00007040514 | 2015.05.26 |
| 10. | වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් සවිබල ගැන්වීම -දින 100 සංවර්ධන වැඩ සටහන | 2015.06.16 |
| 11. | කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල චක්‍රීය ණය වැඩ සටහන පිළිබඳ පරීක්ෂාව | 2015.06.18 |
| 12. | ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම හා ගබඩා කිරීම පිළිබඳ පරික්ෂාව | 2015.06.22 |
| 13. | රුපියල් මිලියන 700 වැසටහන යටතේ 2015 වර්ෂයේ කළුතර දිස්ත්‍රික්කයේ පිහිට වූ ළමා හා කාන්තා සංවර්ධන ඒකක හා ඒ සඳහා කාර්යාලීය උපකරණ ලබා දීම පිළිබඳ සිදුකල භෞතික පරික්ෂණ පිළිබඳ වාර්තාව | 2015.06.25 |
| 14. | කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල චක්‍රීය ණය වැඩසටහන ක්‍රියාත්මක විම පිළිබඳ පරීක්ෂාව | 2015.06.23 |
| 15. | කාන්තාව දේශපාලනයේ බලමුළු ගැන්වීමේ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව-2014-2015 | 2015.07.28 |
| 16. | කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල චක්‍රීය ණය වැඩ සටහන ක්‍රියාත්මක වීම පිළිබඳ පරීක්ෂාව | 2015.09.18 |
| 17. | අභ්‍යන්තර විගණන පරික්ෂාව -බැංකු සැසඳුම් ප්‍රකාශ -2015 සැප්තැම්බර් | 2015.10.12 |
| 18. | ළමා සංවර්ධනය හා කාන්තා හිංසනය වැළැක්වීම සඳහා 2014 වර්ෂයේ වෙන්ව තිබූ රු.මිලියන 600 ප්‍රතිපාදනයට අදාළව කරන ලද ව්‍යාපෘති වල පසුවිපරම් ක්‍රියාවලිය පිළිබඳ පරික්ෂාව | 2015.10.21 |
| 19. | ජාතික කාන්තා කමිටුව විසින් 2015 වර්ෂය තුළ සිදුකල පර්යේෂණ පිළිබඳ විගණන විමසුම | 2015.10.21 |
| 20. | CEDAW හා BEIJING +20 අන්තර්ජාතික සම්මුතීන් පිළිබඳ රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහනේ ප්‍රගතිය පිළිබඳ පරීක්ෂාව | 2015.10.30 |
| 21. | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් ප්‍රා.ලේ.කො.මට්ටමින් චක්‍රීය ණය වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන උපදෙස් | 2015.11.02 |
| 22. | 2013 වර්ෂයේ ක්‍රියාත්මක වූ යුනිසෙෆ් ව්‍යාපෘතිය පිළිබඳ පසු විපරම් පරික්ෂාව-බස්නාහිර පළාත | 2015.11.06 |
| 23. | වාහන නඩත්තු හා අළුත්වැඩියා පිළිබඳ පරික්ෂාව 2015 | 2015.11.06 |
| 24. | අභ්‍යන්තර විගණන පරික්ෂාව -බැංකු සැසඳුම් ප්‍රකාශ 00007040514 | 2015.11.06 |
| 25. | සෙත්සිරිපාය දෙවන අදියර ගොඩනැගිල්ලේ ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය ස්ථාපිත කිරීම | 2015.11.17 |
| 26. | උපදේශන වැඩ සටහන් පැවැත්වීම | 2015.12.09 |

| | | |
|---|---|---|
| 27. | 2015 සැප්තැම්බර් මස ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව | 2015.12.14 |
| 28. | සුළු මුදල් අග්‍රිම පරික්ෂා කිරීම | 2015.12.14 |

## සැලසුම් අංශය

### ප්‍රධාන කාර්යභාරය

01. අමාත්‍යාංශයේ සියලු අංශ සහ දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කර ගනිමින් ඉදිරි සැලසුම් සකස් කිරීම.
02. අමාත්‍යාංශයේ සියලු අංශ සහ දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කර ප්‍රගති වාර්තා සකස් කිරීම
03. සැලසුම් අංශයට අදාළ මාධ්‍ය කටයුතු මාධ්‍ය අංශය හා එක්ව සිදු කිරීම, තොරතුරු බෙදා හැරීම හා සම්බන්ධීකරණය.
04. රාජ්‍ය නොවන සංවිධාන සමඟ පවත්වන වැඩ සටහන් සම්බන්ධීකරණය හා ප්‍රගති වාර්තාකරණය
05. අමාත්‍යාංශය නියෝජනය කරමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් හා දැනුවත් කිරීමේ වැඩ සටහන් වශයෙන් පවත්වන විවිධ උත්සව අවස්ථා සංවිධානය හා සාර්ථකව පැවැත්වීම.
06. විවිධ සමාජ සත්කාරක සේවාවන් සඳහා දායකත්වය ලබා දීම.
07. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩ සටහන් මෙහෙයුම් හා පසු විපරම් කිරීම (ජාතික/දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමේ කාන්තා හා ළමා සංවර්ධන වැඩ සටහන්)
08. සැලසුම් අංශයට අදාළ මූලික විෂයානුබද්ධ තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීන කිරීම.
09. පර්යේෂණ ආයතන වෙත ප්‍රගති වාර්තා හා සැලසුම් ලබා ගැනීම.

### 2015 වර්ෂයේ ක්‍රියාකාරකම්

01. ජාතික පෝෂණ මාසය වෙනුවෙන් (2015 ජුනි) "සුව අහරින් සවිය ලබමු -ශ්‍රම බලයෙන් දැය නංවමු" යන තේමාව යටතේ 2015.07.10 දින අමාත්‍යාංශ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම.

02. i.ඵලදායිතා සංකල්ප ක්‍රියාවට නැංවීම යටතේ සැලසුම් අංශයට අදාළ පහත සඳහන් වැඩ සටහන්වල සම්මත ක්‍රියා පිළිවෙත් සැකසීම.


- පසුවිපරම් හා ප්‍රගති වාර්තාකරණය
- වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරීම
- LLRC වැඩ සටහන
- අමාත්‍යාංශ වෙබ් අඩවිය යාවත් කාලීන කර පවත්වාගෙන යාම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ආපදා කළමනාකරණ වැඩසටහන
- සංවර්ධන වැඩසටහන් ඇගයීම

ii.ඵලදායිතා සංකල්ප යටතේ හරිත ඵලදායිතා සංකල්පය පිළිබඳ කරුණු ඇතුලත් පොතක් පිළියෙල කිරීම.

03. දිනපතා මුද්‍රිත මාධ්‍යවල කාන්තාවන්ට එරෙහිව සිදුවන හිංසන හා අපරාධ වාර්තාවීම් පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යනයක් සිදු කිරීම
04. 2015.06.29 දින බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම.
05. 2015.10.09 දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම.

"සුව අහරින් සවිය ලබමු -ශ්‍රම බලයෙන් දැය නංවමු" අමාත්‍යාංශයීය නිලධාරීන් සඳහා පෝෂණ වැඩ සටහන






කාන්තාවන් හා ළමුන් ඉලක්ක කරගනිමින් පැවැත්වූ ආපදා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩ සටහන- කුරුණෑගල





# සංවර්ධන අංශය

## ප්‍රධාන කාර්යභාරය

අමාත්‍යාංශයීය දැක්ම යථාර්තයක් කර ගැනීමේ අභිලාෂය සාක්සාත් කිරීම උදෙසා අමාත්‍යාංශයේ සියලු ආයතන හා අංශ මෙන්ම එක්සත් ජාතීන්ගේ අනුග්‍රහක ආයතන ඇතුළු අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන වලට අදාල ව්‍යපෘති මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩ සටහන් වලට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, වැඩ සටහන් සම්බන්ධීකරණය කරමින් ජාතික මට්ටමේ සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

## ක්‍රියාවට නංවන ලද වැඩ සටහන් හා ප්‍රගතිය

මෙම වර්ෂයේ දී දිරිය කාන්තා වැඩ සටහන යටතේ රු.85,000,000 අයවැය ඇස්තමේන්තු වෙන් වු අතර වසර අවසානයේ දී මුල්‍ය ප්‍රගතිය රු.83,438,444 විය. ඒ අනුව 98% මුල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

## වැඩ සටහන් අනුව භෞතික හා මුල්‍ය ප්‍රගතිය (දිරිය කාන්තා වැඩ සටහන)

- වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම

23.4% ක්වන වැන්දඹු හා ගෘහ මුලික කාන්තා පවුල්වල ජීවන තත්ත්වය සංවර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරනු ලබයි. මෙහිදී තරුණ වැන්දඹුවන් කෙරෙහි වැඩි අවධානමක් යොමු කරමින් 2015 වර්ෂයේ දි රු.මිලියන 64.459 ක් යාපනය, මන්නාරම, වවුනියාව, මුලතිව්, කිලිනොච්චිය, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 98 ක 2190 දෙනෙකු සඳහා ස්වයංරැකියා අධාර ලබා දෙන ලදි. තවද, මෙම පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ළමා අපයෝජනය හා කාන්තා හිංසන අවම කිරීම වැය විෂය යටතේ වියදම් දරා ඇත.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හි ළමා හා කාන්තා සංවර්ධන ඒකක පිහිටුවීම

ළමා හා කාන්තා සංවර්ධනය සඳහා වන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා මෙම ඒකක ප්‍රාදේශිය ලේකම් කාර්යාල තුළ ස්ථාපිත කිරීමේ කාර්යය 2015 වර්ෂයේදී ද සිදු කරන ලදි.ළමුන් හා කාන්තාවන් පිළිබඳ රජය විසින් ක්‍රියාත්මක කරන වැඩ සටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ දී මනා සම්බන්ධීකරණයකින් හා ප්‍රාදේශීය

ලේකම්වරුන්ගේ සමීප අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ ළමා හා කාන්තා විෂයට අදාළ කටයුතු ඒකාබද්ධ කිරීමෙන් කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් ඇති කිරීම මෙයින් අපේක්ෂා කරයි. රඹුක්කන, වැලිවිටියදිවිතුර, අම්බලන්ගොඩ, මිනුවන්ගොඩ, කොටපොළ, බණ්ඩාරවෙල, වැලිමඩ, කයිට්ස්, කාන්තන්කුඩි, සමන්තුරෙයි, නවදන්වෙලි, කල්මුණේ දෙමළ, මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යන කාර්යාලයන්හි ඒකක 13 ක් සඳහා රු.මි.5.2000ක් වැය කර ඇත.

- ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ විවිධ අමාත්‍යාංශ තුළ සිදු කරන වැඩ සටහන්

රාජ්‍ය ආයතන තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධව කටයුතු කිරීම සඳහා කාන්තා කේන්ද්‍ර සහකාර නිලධාරීන් සෑම අමාත්‍යාංශයකටම අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත. මෙම නිලධාරීන්ගේ කාර්ය භාරය වනුයේ අමාත්‍යාංශවල සේවයේ නියුතු නිලධාරීන්ට කාන්තාවන් හා දරුවන්ට සිදුවන අපයෝජන, හිංසනයන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව අවධානය යොමු කිරීමත් ඒ සඳහා සංවේදීතාවයක් ඇති කිරීමටත් විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමය. මෙම වසර තුළ වැඩ සටහන් 27 ක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා රු.මි.0.3146 ක් වැය කර ඇත.

- මාධ්‍ය හරහා දැනුවත් කිරීමේ වැඩ සටහන් දියත් කිරීම

ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ කාන්තා ප්‍රතිරූපය යහපත් අයුරින් ගොඩනැගීම උදෙසා තීරණාත්මක බලපෑම් ඇති කිරීමට මාධ්‍ය විවිධ පරාසයන් හි සිය කාර්ය භාරය ඉටුකරනු ලබයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සමානාත්මතාවය තහවුරු කිරීම හා දේශපාලන ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය වැඩි කිරීම, කාන්තාවන්ට සිදු වන විවිධාකාරයේ හිංසන, සැහැසි ක්‍රියා තුරන් කිරීම සහ බාල වයස් දැරියන් අඩු වයස් ගැබ් ගැනීම් තුරන් කිරීම උදෙසා වැඩ සටහන් හා කෙටි චිත්‍රපට නිෂ්පාදනය කිරීම හා අත්පත්‍රිකා නිර්මාණය කිරීම මේ යටතේ සිදු කර ඇත.

- තොරතුරු තාක්ෂණ ඒකකය හා කාන්තා දත්ත පද්ධතිය

කාන්තා දත්ත පද්ධතියට අවශ්‍ය තොරතුරු හා සංවර්ධන වැඩ සටහන් වල ප්‍රගතිය ප්‍රාදේශීය මට්ටම තුළදීම පරිගණකයට ඇතුලත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින ක්ෂේත්‍ර නිලධාරීන් පරිගණක පිළිබඳව විධිමත්ව පුහුණු කිරීම හා ඊට අයත් කාර්යයන් සඳහා රු.මි.1.0570 වැය කර ඇත.තවද,අමාත්‍යාංශ තුළ පරිගනක ජාල ගත කිරීම සිදු කර ඇති අතර මේ සඳහා ළමා අපයෝජන හා කාන්තා හිංසන වැළැක්වීමේ වැය විෂය තුළින් රු .මි.8.421 ක් වැය කර ඇත.

## ළමා අපයෝජනය හා කාන්තා හිංසනය වැළැක්වීම

මෙම වර්ෂයේ දී ළමා අපයෝජනය හා කාන්තා හිංසනය වැළැක්වීම වැඩ සටහන යටතේරු.150,000,000 ප්‍රතිපාදන වෙන් වු අතර වසර අවසානයේ දී මූල්‍ය ප්‍රගතිය රු.142,782,965 විය. ඒ අනුව 95% මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

2014 වර්ෂයේ විශේෂ අයවැය යෝජනාවක් අනුව ශ්‍රී ලංකාවේ ළමා අපයෝජන හා කාන්තා හිංසන වැළැක්වීම සඳහා ලබා දෙන ලද රු.මිලියන 600 ප්‍රතිපාදන යටතේ අප අමාත්‍යාංශය විසින් විවිධ වැඩ සටහන් රාශියක් 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මත කරන ලදි.මෙම වැඩ සටහන් ඉදිරියටත් ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේ දී රු.මිලියන 100 ක ප්‍රතිපාදන ලබා දෙන ලදි.

- කාන්තා රැකවරණ මධ්‍යස්ථාන ඉදි කිරීම

  යාපනය දිසත්‍රික්කයේ මරදන්කර්නි, මුලතිවු දිස්ත්‍රික්කයේ මැරටයිම්පත්තු ,මඩකලපු දිස්ත්‍රික්කයේ මන්මුනේ උතුර රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුවගමහි පිහිටි කොලින්ස් ක්‍රසන්ට් රජයේ නිල නිවාසය යන ස්ථානයන් හි ඉදිකරන ලද මධ්‍යස්ථාන සඳහා ඉතිරි කටයුතු නිම කිරීම හා උපකරණ ලබා දීම වෙනුවෙන් රු.මිලියන 5.208 ක් වැය කර ඇත.

- පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ ස්ථාපිත කිරීම

  ළමා අපයෝජනය හා කාන්තා හිංසන වැළැක්වීම සඳහා පොලීසිය මඟින් ඉටු කරන කාර්ය භාරය ශක්තිමත් කිරීම සඳහා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ ස්ථාපිත කරන ලදි. පදවිය,කැබිතිගොල්ලෑව,ගල්කිරියාගම,අරලගංවිල,හිඟුරක්ගොඩ,බිබිල,සියඹලාණ්ඩුව,කන්දකැටිය,කාත්තන්කුඩි,වාලච්චේන,මහඔය,තිරුක්කෝවිල්,පානම,මූතූර්,කන්තලේ,යාපනය,කයිට්ස්,මුලතිව්,මල්ලාවි,මුලාන්කාවිල්,තලෙයිමන්නාරම්,මඩු,බිංගිරිය,ගල්ගමුව,පුත්තලම,කොත්මලේ,සීතාවකපුර යන පොලිස් ස්ථානවල ඒකක ස්ථාපිත කිරීමේ කාර්යයන් අවසන් කිරීම හා එම ස්ථානවලට කාර්යාලීය උපකරණ ලබා දීම මෙම වර්ෂයේ දී සිදු කරන ලදි.මේ සඳහා රු.මිලියන 32.16 වැය කර ඇත.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හි ළමා හා කාන්තා සංවර්ධන ඒකක පිහිටු වීම හා ඒ සඳහා උපකරණ ලබා දීම.

  නැගෙනහිර නුවරගම්පළාත, මහව, කෑගල්ල. කුරුවිට, බලංගොඩ, කොළොන්න, දෙහිඅත්තකණ්ඩිය, මහඔය. රිදිමාලියද්ද, බුත්තල, වත්තල, සීතාවක, ලංකාපුර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මෙම ඒකක ස්ථාපිත කිරීමත්, ගාල්ල, මාතර, රත්නපුර, මොණරාගල, හම්බන්තොට,අම්පාර,පුත්තලම,කොළඹ.කෑගල්ල,පොළොන්නරුව,කළුතර,ගම්පහ,මාතලේ,මහනුවර,කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 107 ක් සඳහා උපකරණ ලබා දීමත් මෙම වැය විෂය යටතේ සිදු කරන ලදි.ඒ අනුව මේ සඳහා රු.මිලියන 23.123 ක් වැය කර ඇත.

- **වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වන ජාතික මධ්‍යස්ථානය**

වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන් සවිබලගැන්වීමට, ඔවුන් මුහුණ දෙන ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීමටත් මෙම කාර්යාලය කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ස්ථාපිත කරන ලදි.ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු සඳහා රු.මි.0.8 ක් වැය කර ඇත.

- **සමීක්ෂණ කටයුතු**

සයිබර් අපරාධ හා ළමා මච්චරුන් පිළිබඳව සමීක්ෂණ දෙකක් පවත්වා ඇති අතර මේ සඳහා රු.මිලියන 2.217 ක් වැය වී ඇත.

වැඩ සටහන් ඇගයීම හා අධීක්ෂණය කිරීම මෙම වැය විෂය යටතේ සිදු කර ඇති අතර මේ සඳහා රු.මිලියන 2.938 වැය වී ඇත.

## විදේශ ව්‍යාපෘති

- එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල යටතේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ස්ථාපිත කර ඇති ළමා හා කාන්තා සංවර්ධන ඒකක සඳහා පරිගණක ඇතුළු කාර්යාලීය උපකරණ ලබා දීම,1938 කාන්තා උපකාරක දුරකථන සේවාව ශක්තිමත් කිරීම යන කාර්යයන් ඉටුකරන ලදි. මේ සඳහා රු.මිලියන 5.460 ක් වැය කර ඇත.

- එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල යටතේ

ක්‍රියාත්මක ව්‍යාපෘතිය යටතේ ,කාන්තාවන් දේශපාලනයේ බලගැන්වීම සඳහා වැඩ සටහන්,අමාත්‍යාංශය යටතේ සිටින උපදේශන සහකාර නිලධාරීන් සඳහා ඩිප්ලෝමා පාඨමාලා ක්‍රියාත්මක කිරීම,වාර්තාමය චිත්‍රපටි නිෂ්පාදනය,සුවනාරී සායන පැවැත්වීම යන වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා රු.මිලියන 11.4431 ක් වැය කර ඇත.





*කාන්තා රැකවරණ මධ්‍යස්ථානය -මුලතිව්*



*පොලිස් හා කාන්තා රැකවරණ මධ්‍යථානය -මුලන්කාවිල්*



*වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වන ජාතික මධ්‍යස්ථානය*




*ළමා හා කාන්තා සංවර්ධන ඒකක*




*දිවා සුරකුම් මධ්‍යස්ථානය*



## ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

### දැක්ම

ශ්‍රී ලාංකීය ජනසමාජය උදෙසා තීක්ෂණ ,සංවේදී හා විශ්වාසයෙන් යුතු කාන්තා පරපුරක් නිර්මාණය කරන ජාතික ආයතනය බවට පත් කිරීම.

### මෙහෙවර


සිය බුද්ධියද ශක්තියද උපරිම හා යහපත් ලෙස භාවිතා කරමින් ස්වශක්තියෙන් අභියෝගයන්ට මුහුණ දෙන ශ්‍රී ලාංකීය කාන්තා පරපුරක් සඳහා උචිත පරිසරයක් නිර්මාණය කිරීමට විධිමත් සංවිධාන රාමුවක් ඔස්සේ සැලසුම් සහගත වූ දැනුවත් බව ලබා දෙමින් සිදු කෙරෙන සමාජීය හා ආර්ථික බල ගැන්වීම මඟින් රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව කාන්තා අභිවෘද්ධිය උදෙසා ක්‍රියාත්මක වන ජාතික යාන්ත්‍රණය බවට පත්වීම.

## අරමුණු

- ආර්ථික ,සමාජයීය ,අධ්‍යාපනික, දේශපාලනික හා සංස්කෘතික ආදී ක්ෂේත්‍රයන් තුළ ශ්‍රී ලාංකීය කාන්තාවන්ට සමාන අයිතිවාසිකම් භුක්ති විඳීමට අවස්ථාව සලසා දීම.
- කාන්තාවන් වූ නිසාම නොයෙකුත් ක්ෂේත්‍ර තුළ දැනට අත්විඳින බාධා ඉවත් කිරීම සඳහා ඔවුන් සවිබල ගැන්වීම.
- කාන්තාවන්ට සම අයිතිවාසිකම් හා සම අවස්ථා තහවුරු විය යුතු අංශ හඳුනා ගැනීම,ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමට සහය දීම සහ ඒ සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

## ප්‍රධාන කාර්යභාරය

- ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික වශයෙන්ද, සමාජීය වශයෙන්ද බල ගැන්වීම සඳහා සුදුසු වැඩ සටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම , සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම.
- සියලුම වයස් පරාසවල කාන්තාවන්ගේ සුවිශේෂිතා හඳුනාගෙන ඔවුන් උචිත පරිදි රටේ සමස්ත සංවර්ධනයේ කොටස්කරුවන් කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තාවන්වීම නිසාම ඔවුන් මුහුණදෙන සමාජීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- සමාජයේ විශේෂ හේතූන් නිසා විවිධ පීඩාවන්ට මුහුණදෙන කාන්තාවන් අරභයා විශේෂ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- සමස්ත කාන්තා පරපුරේ දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ තලයකට නංවාලීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තාවන්ට එකම සංවිධානය තුළ ක්‍රියාත්මක වීම සඳහා(Smooth Functioning) ප්‍රජා මූල මට්ටමේ සිට ජාතික තලය දක්වා කාන්තාවන් එකම ජාලයක් තුළ සංවිධාන ගත කිරීම.


වැඩ සටහන් ව්‍යුහය
ආර්ථික වශයෙන් බලගැන්විමේ වැඩසටහන්
සමාජීය වශයෙන්බලගැන්වීම්
වෙනත් වැඩ සටහන්
වැන්දඹු හා ගෘහමුලික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම
පශු සම්පත් වැඩ සටහන
ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ වැඩ සටහන
ශිල්පීය පුහුණු වැඩ සටහන
කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවිපොළ
චක්‍රීය ණය වැඩ සටහන
වනිතා ශක්ති පදනම
විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් මෙරට තුලදී ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම
"දිරිය දැතට සවිය "ධීවර කාන්තාවන් සවිබල ගැන්වීම
කාන්තා රැකවරණ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම
උපදේශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම
"සුව දිවියට පෝෂණය" නමින් වූ පෝෂණ වැඩ සටහන
වතුකරයේ කාන්තාවන් සඳහා මූල්‍ය කළමනාකරණ වැඩ සටහන
නව යෞවනියන්ගේ ජීවන කුසලතා හා ප්‍රජනන සෞඛ්‍ය වැඩ සටහන
කාන්තා සංවිධාන ජාලය ශක්තිමත් කිරීම
බන්ධනාගාරගත කාන්තාවන් සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ වැඩ සටහන්
ජාත්‍යන්තර කාන්තා දිනයට හා ගැහැණු දරුවාගේ දිනයට සමගාමී වැඩ සටහන්
දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය හා පසු විපරම් කටයුතු
නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩ සටහන්
මාධ්‍ය හා ප්‍රචාරණය හා පුස්තකාලය පවත්වාගෙන යාම

## ක්‍රියාවට නංවන ලද වැඩ සටහන් හා ප්‍රගතිය

මෙම වර්ෂයේ දී කාන්තා සවිය වැඩ සටහන යටතේ රු.40,000,000 අයවැය ඇස්තමේන්තු වෙන් වු අතර වසර අවසානයේ දී මුල්‍ය ප්‍රගතිය රු.38,373,078 විය. ඒ අනුව 95% මුල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

## ආර්ථික වශයෙන් බලගැන්වීමේ වැඩ සටහන්

### ➢ වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම.

යුද්ධය හේතුවෙන් වැන්දඹු වූ රැකියා විරහිතව සිටින කාන්තාවන් හා වෙනත් හේතූන් නිසා වැන්දඹු වූ හා ගෘහමූලික කාන්තාවන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමත්, ඔවුන්ගේ සමාජයීය තත්ත්වයන් ගොඩනංවාගැනීමටත් හැකිවන පරිදි මෙම වැඩ සටහන සැලසුම් කර ඇත. මේ යටතේ 2015 වර්ෂය තුළදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 110 ක ප්‍රතිලාභීන් 331 ක් වෙත ස්වයංරැකියා ආධාර ලබා දුන් අතර ඒ සඳහා රු.මි.10.097 ක් වැය කර ඇත.

### ➢ පශු සම්පත් වැඩ සටහන

දියර කිරි පරිභෝජනය තුලින් පවුල් පෝෂණය, ඓන්ද්‍රීය අපද්‍රව්‍ය තුලින් කාබනික පොහොර නිෂ්පාදනය හා ගෙවතු වගා කටයුතු දිරිමත් කිරීම , ජීව වායු නිෂ්පාදනය, අතුරු ආදායම් මාර්ග තුලින් ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා දේශීය කිරි අවශ්‍යතාවය 55% දක්වා දේශීයව උපයා ගැනීම හා කිරි වීදුරුව වැඩ සටහනට සාධනීය දායකත්වයක් ඇති කරලීම සඳහා මෙම වැඩ සටහන සැලසුම් කර ඇති අතර කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන් උදෙසා ක්‍රියාත්මක වේ.මෙහිදී මූලිකවම ප්‍රතිලාභීන්ට සත්ව පාලනය පිළිබඳව පුහුණු වීමක් ලබා දෙන අතර පුහුණුවෙන් පසු කිරි දෙනුන් ලබා ගැනීමට වක්‍රීයව ක්‍රියාත්මක වන පරිදි ණය ලබා දීම සිදු කරනු ලබයි.

### ➢ ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ පුහුණු වැඩ සටහන (ව්‍යවසායක සංවර්ධන පුහුණු )

ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අවශ්‍ය කළමනාකරණ ව්‍යවසායක හා ගිණුම් කටයුතු පිළිබඳව දැනුම ලබා දීම හා ව්‍යාපාර ගැන්වීමට පෙළඹවීම මෙමගින් සිදු කරනු ලබයි. මෙහිදී ජාතික ශිල්ප සභාව, ලක්සල, හස්ත කර්මාන්ත, අත්කම් නිර්මාන,කෘෂි කර්ම දෙපාර්තමේන්තුව,විදාතා පුහුණු මධ්‍යස්ථාන,පේෂ කර්මාන්ත අමාත්‍යාංශය යන ආයතනවල ප්‍රවීන පුහුණු කරුවන් විසින් පුහුණු වීම් ලබා දීමත්, නිෂ්පාදන අමුද්‍රව්‍ය පහසුකම් සැලසීම හා අලෙවිය සඳහා වෙළඳපල අවස්ථා හඳුන්වාදීමටත් හැකි වන පරිදි මෙම වැඩ සටහන සැලසුම්කර ඇත. 2015 වර්ෂයේ දී ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ වැඩ සටහන් 72 ක් ප්‍රතිලාභීන් 3495 ක් සඳහා ද, ශිල්පීය පුහුණු වැඩ සටහන් 20 ක් ප්‍රතිලාභීන් 200 ක් සඳහාද අලෙවිපොළ අවස්ථා වැඩි කිරිම වෙනුවෙන් ද මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි.මේ සඳහා රු.මිලියන 4.003 වැය වී ඇත.

## ➢ චක්‍රීය ණය වැඩ සටහන

ආයෝජන සඳහා යෙදවුම් ප්‍රමාණය ඉහල නැංවීම සඳහා කාන්තා කාර්ය සංවිධානවල ලියාපදිංචි සාමාජිකාවන් වෙත මෙම ණය ක්‍රමය ක්‍රියාත්මක වේ.2015 වර්ෂයේ දී රු.මිලියන 0.283 වැය කර ඇත.

## ➢ වනිතා ශක්ති බැංකු පදනම

කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන් ඉතිරි කිරීම් සඳහා පෙළඹවීමට ස්ථාපිත කර ඇති වනිතා ශක්ති බැංකු පදනම්වල කාර්යය මණ්ඩලය පුහුණු කිරීම, අධීක්ෂණ කටයුතු කිරීම මෙම වසරේද සිදු විය.පුහුණු වැඩමුළුවක් හා බැංකු 18 ක් අධීක්ෂණය කර ඇති අතර ඒ සඳහා රු.මි.0.193 වැය කර ඇත.

## ➢ විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් මෙරට තුළදී ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම

විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් විදේශගතවීම නිසා ඇතිවන අයහපත් ප්‍රතිඵල හා විදේශගතවීම වෙනුවට දේශීය වශයෙන් රැකියා අවස්ථා හඳුන්වා දීම සහ ඊට කාන්තාවන් උනන්දුකර වීම සඳහා මේ යටතේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි. 2015 වර්ෂයේ දී රු.මි.2.980 ක් වැය කර ඇති අතර වැඩ සටහන් 14 ක් ප්‍රතිලාභීන් 1511 දෙනෙකු වෙනුවෙන් පවත්වා ඇත.

## ➢ "දිරිය දැතට සවිය "ධීවර කාන්තාවන් සවිබල ගැන්වීම

ධීවර ප්‍රජාවන්හි කාන්තා කාර්ය සංවිධාන සමාජිකාවන්ගේ ආර්ථිකය නංවාලීම සඳහා දිරිය දැතට සවිය ධීවර කාන්තා වැඩ සටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8 ක ක්‍රියාත්මක කරන ලදි.මෙහිදී ධිවර කර්මාන්තයට අවශ්‍ය උපකරණ දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදනය කිරීම අරමුණ වන අතර රු මි.0.9360 වැය කර ඇත.

## සාමාජීය වශයෙන් බලගැන්වීමේ වැඩ සටහන්.

ශ්‍රී ලාංකේය කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඔවුන් වෙත ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම මෙහිදී සිදු කරනු ලබයි.මේ යටතේ,

### 01.රැකවරණ මධ්‍යස්ථාන

නීති විරෝධී මිනිස් වෙළඳාමට හසු වූ දේශීය හා විදේශීය කාන්තා වින්දිතයින් හා ඔවුන්ගේ දරුවන් අදාළ ගැටළුව විසදෙන තෙක් ආරක්ෂිතව රඳවා තැබීම හා ඔවුනට රැකවරණය සැලසීම, උපදේශනය, නීතිමය කටයුතු සඳහා පහසුකම් සැලසීම, සෞඛ්‍ය පහසුකම් හා ඔවුන්ගේ මූලික අවශ්‍යතා සැපයීම(ආහාර,ඇඳුම් ) මෙම මධ්‍යස්ථාන වලින් ඉටුවන කාර්යයන් වේ.මෙම රැකවරණ මධ්‍යස්ථාන 02 පවත්වාගෙන යාම වෙනුවෙන් රු .මි.1.410 වැය කර ඇත.

### 02. උපදේශන වැඩ සටහන් හා උපදේශන මධ්‍යස්ථාන

පීඩාවටපත් වූ කාන්තාවන්ට හා ළමුන්ට මනෝ විද්‍යාත්මක උපදේශන ලබා දෙමින් ඔවුනට සේවා ලබා ගත හැකි පුද්ගයින් හා ආයතන වෙත යොමු කිරීමත් ජීවිතයේ පැන නගින ගැටළු විසදා ගැනීමේ දී මනෝ විද්‍යාත්මක ක්‍රම භාවිතයට හුරු කිරීම අරභයා උපදේශන මධ්‍යස්ථාන 12 ක් උපදේශන නිලධාරින් යටතේ පවත්වාගෙන යන අතර ඊට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා උපදේශන සහකාර නිලධාරීන් අනුයුක්ත කර ඇත. එමඟින් සමාජීය ගැටළු සඳහා විසැඳුම් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබයි.2015 වර්ෂය තුළ දී පුද්ගලයින් 18149 දෙනෙකු සඳහා මනෝඋපදේශන මගපෙන්වීම් සිදුකර ඇති අතර නිලධාරීන් පුහුණු කිරීම් වැඩ සටහන් 4 ක් පවත්වා ඇත.මේ සඳහා රු.මි.5.099 වැය කර ඇත.

### 03. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන හා තැනැත්තන් වෙළඳාම වැළැක්වීමේ වැඩ සටහන

කාන්තාවන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්තීන් හා සම්මුතීන් පිළිබඳවත් , කාන්තා අයිතිවාසිකම් හා ස්ත්‍රී පුරුෂභාවය නිසා සිදුවන හිංසන අවස්ථාවන් හඳුනාගැනීමටත් ඉන් මිදීමටත් අවශ්‍ය නීතිමය උපදෙස් ලබා ගැනීමේ මාර්ග පිළිබඳවත් දැනුම ලබා දීම,තැනැත්තන් වෙළඳාම, තැනැත්තන් වෙළඳාමට හසුවන අවස්ථා හඳුනාගැනීම,ලිංගික සූරාකෑම් යනාදිය පිළිබඳව කාන්තාවන් දැනුවත් කිරීම මෙම වැඩ සටහනින් බලාපොරොත්තු වේ.ප්‍රතිලාභීන් 400 ක් වෙනුවෙන් වැඩ සටහන් 40 ක් මෙම වසරේ සිදුකර ඇති අතර ඒ සඳහා රු.මිලියන 0.982 වැය වී ඇත.

## 04.සුව දිවියට පෝෂණ වැඩ සටහන

අනාගත සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් උදෙසා සෞඛ්‍ය,පෝෂණීය,සනීපාරක්ෂණය පිළිබඳව දැනුම කාන්තාවන්ට අත්‍යවශ්‍ය වේ. මෙමගින් නීරෝගී ප්‍රජාවක් ජාතික සංවර්ධනයට දායක කරවීමට හැකියාවක් ඇතිවන අතර රාසායනික ද්‍රව්‍ය අවභාවිතයෙන් අහාර නිෂ්පාදනය සඳහා පෙළඹවීමක් සිදු කිරීම කරනු ලබයි. වැඩ සටහන් 51 ක් ප්‍රතිලාභීන් 5619 උදෙසා සිදු කර ඇති අතර ඒ සඳහා රු.මිලියන 1.939 ක් වැය කර ඇත.

## 05.වතුකරයේ කාන්තාවන් සඳහා මූල්‍ය කළමනාකරණ වැඩ සටහන

සමාජීය, ආර්ථික හා සංස්කෘතික වශයෙන් වතුකරයෙන් කාන්තාවන්ගේ තත්ත්වය ඉහල නැංවීම සඳහා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාවට නංවමින් පෝෂණය වැඩි දියුණු කිරීම, මත්ද්‍රව්‍ය නිවාරණය,විදේශගතවීමට අපේක්ෂාවෙන් සිටින වතුකරයේ කාන්තාවන් විකල්ප ආදායම් මාර්ග සඳහා පෙළඹවීමටත්, අධ්‍යාපනය,කුට්ටනය හා හිංසාව අවමකිරීම සඳහාත් වතු ප්‍රජාව වාසය කරන ප්‍රාදේශී ලේකම් කොට්ඨාස 51 ක ප්‍රතිලාභීන් 5467 සම්බන්ධකර ගනිමින් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි .මේ සඳහා රු.මි.2.015 ක් වැය කර ඇත.

## 06.නව යෞවනියන්ගේ ජීවන කුසලතා හා ප්‍රජනන සෞඛ්‍ය වැඩ සටහන

නව යොවුන්වියේ ගැහැණු දරුවන්ගේ කුසලතාවය හා දැනුම වර්ධනය කිරීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 50 ක නව යෞවනියන් 7293 දෙනෙකු සම්බන්ධකර ගනිමින් වැඩ සටහන් පවත්වා ඇත. මේ සඳහා රු.මි.1.987 ක් දරා ඇත.

## 07.කාන්තා සංවිධාන ජාලය ශක්තිමත් කිරීම

කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ඔවුන්ගේ සංවර්ධනය වෙනුවෙන් කණ්ඩායමක් වශයෙන් ක්‍රියා කිරීමට සංවිධාන ජාලයක් බිහිකිරීම හා ඔවුන් නායකත්වයට පුහුණු කිරීම සඳහා පිහිටුවා ඇති ග්‍රාමීය මට්ටමේ වූ කාන්තා කාර්ය සංවිධාන , ප්‍රාදේශීය කාන්තා බල මණ්ඩල හා දිස්ත්‍රික් කාන්තා බල මණ්ඩල ශක්තිමත් කිරීම යටිතල පහසුකම් ඇතුළු සේවා සැපයීම.මේ සඳහා රු.මි.2.061 වැය කර ඇත.

## 08.බන්ධනාගාරගත කාන්තාවන් සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ වැඩ සටහන්

සුළු වැරදිමත බන්ධනාගාර ගත කාන්තාවන් නැවත නැවත එම වැරදි වලට යොමුවීම වලක්වා යහපත් අයුරින් සමාජගත කිරීම සඳහා මෙම වැඩ සටහන බන්ධනාගාර තුළ ක්‍රියාත්මක කරනු ලබයි.මෙහිදී මැහුම් පාඨමාල හා අත්කම් නිෂ්පාදන පිළිබඳව පුහුණු වීම් ලබා දෙනු ලබයි. ප්‍රතිලාභීන් 324 ක් සඳහා වැඩ සටහන් 07ක් 2015 වර්ෂයේ පවත්වා ඇත. මේ සඳහා රු.මි.0.485 ක් වැය කර ඇත.

## 09.වෙනත් වැඩ සටහන්

දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය හා පසු විපරම් කටයුතු, නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩ සටහන්,මාධ්‍ය හා ප්‍රචාරණය හා පුස්තකාලය පවත්වාගෙන යාම යන කාර්යයන් ඉතා සාර්ථකව ඉටු කර ඇති අතර මේ සඳහා 2015 වර්ෂයේ දී රු.මිලියන 3.063 ක් වැය කර ඇත.

*ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම - වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන්*




*ආදායම් උත්පාදන වැඩ සටහන්*




*ප්‍රජාව දැනුවත් කිරීම*





## ජාතික කාන්තා කමිටුව

**දැක්ම**

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු වූ, හිංසනයෙන් තොර, කාන්තාවන්ට හිතකර ශ්‍රී ලාංකික සමාජයක්

**මෙහෙවර**

ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම හා පූර්ණ සංවර්ධනයට ඉවහලවන ප්‍රතිපත්ති හා නීති පද්ධතීන් සකස් කිරීම සඳහා නිර්දේශ හා සහාය ලබා දීම සහ නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට පෙළඹවීම හා අධීක්ෂණය කර ඇගයීම.

**ප්‍රධාන කාර්ය භාරය**

- ස්ත්‍රී පුරුෂභාවය මත ඇතිවන වෙනස්කම් පිළිබඳ වූ පැමිණිලි බාරගැනීම්, සංනිරීක්ෂණය හා ඒවා අදාළ පාලක, බලධාරීන්, සම්බන්ධිත තැනැත්තන් හෝ මණ්ඩල වෙත අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීම.
- කාන්තා ප්‍රඥප්තියේ ඇතුළත් විධිවිධාන කඩ කිරීම සම්බන්ධයෙන් වන පැමිණිලි, සහන, නෛතික ආධාර හෝ සමථ සේවා සඳහා රජයේ හෝ රජයේ නොවන හෝ සංවිධාන වෙත යොමු කිරීම.
- එම ක්‍රියාමාර්ග සමීක්ෂණය,අදාළ පාලන බලධාරීන්ගෙන් වාර්ෂික ප්‍රගති වාර්තා ලබා ගැනීම සහ එම වාර්තා රට තුළ ප්‍රචලිත කිරීම ආදියට අවස්ථා සැලසීම.
- ප්‍රඥප්තියේ අන්තර්ගතව ඇති පරිදි, කාන්තා අයිතිවාසිකම් සහ වගකීම් විෂයෙහි නෛතික සහ සංවර්ධන ප්‍රතිපත්ති වලින් ඇතිවන බලපෑම් ඇගයීම.
- අදාළ පර්යේෂණ දිරිගැන්වීම තුළින් ප්‍රඥප්තියේ අරමුණු සපුරා ගැනීමට උපකාරී වීම සහ එම පර්යේෂණ පදනම් කර ගත් ප්‍රතිසංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳව විෂයභාර අමාත්‍යවරයා විසින් කමිටුවේ අවධානයට යොමු කෙරෙන කරුණු පිළිබඳව හෝ උචිතයයි කමිටුව සිතන කටයුතු, කිරීමට උපදෙස් දීම.

## ක්‍රියාවට නංවන ලද වැඩ සටහන් හා ප්‍රගතිය

- **පෙළඹවීම්,දැනුවත් කිරීම් , ධාරිතා සංවර්ධන වැඩ සටහන්**

සීඩෝ ප්‍රඥප්තිය පිළිබඳව රාජ්‍ය නිලධාරීන් 350 ක් දැනුවත් කිරිම. වැඩ සටහන් 9 ක් පවත්වන ලදි.මේ සඳහා රු.මිලියන 1.1273 ක් වැය වි ඇත.

කාන්තාවන්ට සිදුවන හිංසන සම්බන්ධයෙන් සංවේදීව ක්‍රියා කිරීමට, පොලිස් නිලධාරින් දැනුවත් කිරීම.මෙහිදි පොලිස් නිලධාරීන් 238ක් දැනුවත් කර ඇත.මේ සඳහා වැඩ සටහන් 2ක් පවත්වා ඇත.රු.මිලියන 0.1869ක් වැයකර ඇත.

සේවා ස්ථානවල ඇති වන හිංසන වළක්වා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන අතර මෙම වසරේ කටුනායක,අවිස්සාවේල්ල,හොරණ පිහිටි නිදහස් වෙළඳ කලාපවල කාන්තාවන් වෙනුවෙන් වැඩ සටහන් 4 ක් ක්‍රියාත්මක කරන ලදි.මේ සඳහා රු.මිලියන 0.1062 ක් වැය කර ඇත.

පාසල් දරුවන් හා ප්‍රජා මූලික සංවිධාන ළමා මව්වරුන් මුහුණ දෙන සෞඛ්‍යමය හා සමාජමය ප්‍රතිවිපාකයන් පිළිබඳ දැනුම ලබා දීමේ අරමුණින් බාල වයස් ගැබ් ගැනීම් තුරන් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබයි. වැඩ සටහන් 05 ක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා රු.මිලියන 0.4248 ක් වැය කර ඇත.

කාන්තාවන්ට සිදුවන සියලු ආකාරයේ හිංසන වැළැක්වීම සඳහා වන එක්සත් ජාතීන්ගේ දින 16 වැඩ සටහනට සමගාමීව වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි.මේ සඳහා රු.මිලියන 1.51 ක් වැය කර ඇත.

කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම පිළිබඳව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය බල මණ්ඩල කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩ සටහන් යටතේ විලච්චියේ වැඩ සටහනක් පවත්වා ඇත.මේ සඳහා රු.මිලියන 0.065 ක් වැය කර ඇත.

දේශපාලන ක්ෂේත්‍රය වෙත කාන්තාවන් බලමුළු ගැන්වීම සඳහා ඩිප්ලෝමා පාඨමාලාවක් හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පවත්වන ලදි.මේ සඳහා ශිෂ්‍යාවන් 28දෙනෙකු සහභාගී වි ඇති අතර ඒ සඳහා රු.මිලියන 1.48 ක් වැය වී ඇත.

- **පර්යේෂණ**

වතු අංශයේ කාන්තාවන්ට සිදුවන හිංසන පිළිබඳ පර්යේෂණයක් මෙම වසරේ සිදු කර ඇති අතර ඒ සඳහා රු.මිලියන 0.728 ක් වැය කර ඇත.

## ➢ මණ්ඩප සාකච්ඡා

අවිධිමත් අංශයේ කාන්තාවන්ගේ වැටුප් නීතිගත කිරීම, සමාජයීය සන්නිවේදන ජාලය කාන්තාවන්ට බලපාන ආකාරය, විවාහ වීමේ කැමැත්ත ලබාදීමේ වයස අවුරුදු 16 සංකල්පය යන තේමා යටතේ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන විද්වත් පිරිස් 50 කින් යුතු කණ්ඩායම් සහභාගිත්වයෙන් මෙම සාකච්ඡා පවත්වන ලදි.මේ සඳහා රු.මිලියන 0.2954 ක් වැය කර ඇත.

## ➢ මාධ්‍ය වැඩ සටහන් හා මාධ්‍ය ප්‍රකාශ සංවර්ධනය කිරීම


කාන්තාවන්ගේ වර්තමාන ගැටළු පිළිබඳ ගුවන්විදුලි වැඩ සටහන් 08 ක් ප්‍රචාරණය කර ඇත. “ප්‍රගතියේ හවුල්කරුවෝ" වාර්ෂික සඟරාව, "වනිතා විභව" කාර්තුමය සඟරාව මුද්‍රණය කර බෙදාහැර ඇත.ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් සතුටු පවුල චිත්‍රපටයේ රඟත වැඩ සටහන් යටතේ වන මාධ්‍ය වැඩසටහන.මේ සඳහා රු.මිලියන 0.848 වැය කර ඇත.

ස්ත්‍රීපුරුෂ සමාජභාවී හිංසනයන් වැළැක්වීම,බාලවයස්කාර ගැබ් ගැනීම් තුරන් කිරීම,කාන්තා උපකාරක දුරකථන සේවාව 1938 හා සේවා ස්ථානවල සිදුවන ලිංගික අතවර තුරන් කිරීම උදෙසා පෝස්ටර්, ස්ටිකර් මුද්‍රණය කිරීම හා කෙටි වාර්තාමය චිත්‍රපට නිෂ්පාදනය යන දෑ සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.මිලියන 1.026 ක් වැය කර ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනයන් අවම කිරීමේ හා කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන්හි ප්‍රතිඵල හා එම වැඩ සටහන් සංවර්ධනය කළයුතු අවස්ථා පිළිබඳව අධ්‍යනය කර සොයා බැලීම වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහය ඇතිව ඇගයීමක් සිදු කර ඇත.ඒ සඳහා රු.මිලියන 0.3555 ක් වැය කර ඇත.

## ➢ 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව

මෙම සේවාව ශක්තිමත් කිරීම වෙනුවෙන් 2015 වර්ෂය තුළ රු.මිලියන 0.22 ක් වැය කර ඇත.



*සීඩෝ ප්‍රඥප්තිය පිළිබඳව දැනුවත් කිරීම්*

*ගුවන් විදුලි වැඩ සටහන්*





*පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම්*

*මණ්ඩප සාකච්ඡා*






*සේවා ස්ථානවල හිංසන වැළැක්වීම සඳහා වන දැනුවත් කිරීම්*







## ළමා ලේකම් කාර්යාලය

**දැක්ම**

**ශාරීරික ,මනෝ සමාජීය සහ ප්‍රජනන සංවර්ධනයෙන් යුතු ශ්‍රී ලාංකේය මුල් ළමාවිය දරු පරපුරක් බිහි කිරීම.**

**මෙහෙවර**

ජාතික මට්ටමේ කේන්ද්‍රීය ආයතනය ලෙස ප්‍රතිපත්ති හා වැඩ සටහන් සම්පාදනය,ක්‍රියාත්මක කිරීම,ඇගයීම හා පසු විපරම් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය දරුවන්ගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම.

**ප්‍රධාන කාර්යභාරය**

- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ලෙස කටයුතු කිරිම.
- රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මුල් ළමාවිය සංවර්ධන වැඩ සටහන් සම්බන්ධීකරණය හා ජාලගත කිරිම.
- මුල් ළමාවිය සත්කාරය හා සංවර්ධනයට අදාළ වන පර්යේෂණ සිදු කිරිම, දත්ත රැස් කිරිම සහ වැඩ සටහන් සම්පාදනය කිරිම.
- මුල් ළමාවියේ දරුවාගේ සමස්ථ සංවර්ධනය සඳහා අදාළ වන පුහුණු වැඩ සටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරිම.
- මුල් ළමාවියේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරිම සහ ඔවුන් තුළ ඒ පිළිබඳ සංවේදීභාවයක් ඇති කිරිම.

# ක්‍රියාවට නංවන ලද වැඩ සටහන් හා ප්‍රගතිය

## විශේෂ වැඩ සටහන්

- **පෙර පාසල් ළමුන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන**

පෝෂණ ඌනතාවයෙන් පෙළෙන අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ පෝෂණ තත්ත්වය නගා සිටුවීමටත්, දේශීය කිරි ගොවියා ශක්තිමත් කිරීමත් අරමුණු කර ගනිමින් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි. පෙර පාසල් 6014 ක දරුවන් 130,000 ක් වෙනුවෙන් රු.මිලියන 188.820 ක් 2015 වර්ෂයේ දී වැය කරන ලදි.

- **ගර්භනී මව්වරුන්ට රු.20,000/- පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන**

වර්තමාන රජයේ දින 100 වැඩසටහන යටතේ අඩු බර දරු උපත් ශ්‍රී ලංකාව තුළ අවම කිරීමේ අරමුණින් දරුවකු ප්‍රසූත කරන සෑම මවකටම රු.20,000/- ක පෝෂණ දීමනාවක් ලබා දීම සඳහා ක්‍රියාවට නංවන ලද මෙම වැඩ සටහනින් මසකට රු.2,000/-ක් වශයෙන් මාස 10 ක් තුළ දි මෙම දීමනාව ලබා දෙන අතර ගර්භනී සමයේ මවකට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ අඩංගු ආහාර ද්‍රව්‍යවලින් සමන්විත පෝෂණ ඇසුරුමක් ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ලියාපදිංචි වන සෑම ගර්භනී මවක් සඳහාම මෙම දීමනාව හිමි වේ.

- **ළමා දිරිය පෙර පාසල් ගුරුවරියන් සඳහා රු.250/-ක් ලබාදීමේ වැඩසටහන**

පෙර පාසල්/මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සේවාවන් වඩාත් ශක්තිමත් හා වැඩිදියුණු කිරීමේ අරමුණින් 2015 අතුරු අයවැය යෝජනා යටතේ පෙර පාසල් / මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරියන් සඳහා මාසිකව රු.250/- ක දීමනාවක් 2015 ජුනි මස සිට ගෙවීමට තීරණය කරන ලද අතර, එය ළමා ලේකම් කාර්යාලය විසින් ක්‍රියාවට නංවන ලදි.ඒ අනුව සුදුසුකම් ලැබූ පෙර පාසල් ගුරුවරියන් 7975 දෙනෙකු සඳහා රු.මිලියන 9.964 ක මුදලක් වැය කරමින් වාරික 07 ක් ලබා දී ඇත.





## ළමා සවිය වැඩසටහන

මෙම වැඩසටහන සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.15කි. ලෝක ළමා දින වැඩසටහන් , දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු පිහිටුවීම, සහ මුල් ළමාවිය දරුවන් සඳහා සෞන්දර්යාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක කර ඇත.

I.2015 වර්ෂයේ දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා වෙන්ව තිබූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.0.5කි. වෙන් කරන ලද ප්‍රතිපාදන මුදලින්රු.393,850.00ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කර ඇත. ඒ අනුව 2015.12.31 දිනට රු.මි. 0.229 ක මූල්‍ය ප්‍රගතියක් සහ භෞතික ප්‍රගතිය, කමිටු 36 ක් වශයෙන් පෙන්නුම් කර තිබේ.

II.ලෝක ළමා දිනය වෙනුවෙන් පවත්වන ලද ජාතික වැඩසටහන යාපනය වීරසිංහම් ශාලාවේ දී පවත්වන ලද අතර ඒ සඳහා රු.මි. 6.280 ක් මුලින් වෙන් කර තිබුණ ද ලෝක ළමා දින ජාතික වැඩසටහන සඳහා රු.මි. 8.527ක මුදලක් වැය වී ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් විවිධ දැනුවත් කිරීමේ වැඩමුළු සහ පෙර පාසල් දරුවන් සඳහා රසවින්දනාත්මක වැඩසටහන් යනාදිය ක්‍රියාත්මක කිරීම සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට රු.12,500.00 බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 322 ක් සඳහා රු.මි.4.02ක ප්රතිපාදන නිදහස් කර ඇත. වාර්තා වී ඇති තොරතුරු අනුව වැඩසටහන් 305 සිදුකර ඇති අතර ඒ සඳහා රු.මි. 3.801 ක් වැය වී ඇත. මෙම වැඩසටහන් ඔක්තෝම්බර් පළමු වනදා සහ ඔක්තෝම්බර් මාසය පුරාවට පවත්වන ලදී.

III. 2015 වර්ෂයේ මුල් ළමාවිය දරුවන් සඳහා වූ සෞන්දර්යාත්මක වැඩසටහන් 271 ක් සිදු කිරීම සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට රු.15,000.00 බැගින් රු.මි 4.06 ක ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර මේ වන විට ඉන් වැඩසටහන් 271 සිදු කර ඇති අතර ඒ සඳහා වැය වී ඇති මුදල රු.මි.4.06 කි.

*ළමා සංවර්ධන කමිටු රැස්වීම්*



*සෞන්දර්යාත්මක වැඩසටහන්*



## මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ වැඩ සටහන

මේ යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.40 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර පහත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක වේ.

### I.‘‘සෙනෙහෙ තටාක’’ නිවස පදනම් කර ගත් මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ නිවස ආශ්‍රිත පරිසරය සහ නිවසේ එදිනෙදා සිදු කරනු ලබන කාර්යයන්වල දී මුල් ළමා වියේ දරුවන් සම්බන්ධ කර ගැනීම මගින් ඔවුන්ගේ සමස්ත සංවර්ධනය ඇති කිරීමයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දෙමාපියන් දැනුවත් කිරීම, රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම , තරුණ කණ්ඩායම් දැනුවත් කිරීම වැනි කාර්යයන් මේ යටතේ සිදු කරනු ලබයි. 2015 වර්ෂයේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් වැඩසටහන් 335ක් පවත්වා ඇති අතර එහි මූල්‍ය ප්‍රගතිය රු.මි. 2.010 කි.

### II. "පෝෂණ මංපෙත" ආහාර හා පෝෂණ වැඩසටහන

මුල් ළමා වියේ දරුවන්ගේ ආහාර හා පෝෂණය පිළිබඳ දෙමාපියන් හා පෙර පාසල් ගුරුවරියන් දැනුවත් කිරීම, පෝෂණීය ආහාර වේලක් සකස් කර ගන්නා අන්දම පිළිබඳ දැනුවත් කිරීමත් මෙම වැඩසටහනේ අරමුණු වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. 2015 වර්ෂයේ වැඩසටහන් 280 ක් පමණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදු කර ඇත. ඒ සඳහා වියදම රු.මි.2.8කි.

### III. "නැණදීපනී " පෙර පාසල් ගුරුවරියන් සඳහා වූ එක් දින දිශාභිමුඛ ගුරු පුහුණු වැඩසටහන

පෙර පාසල් ගුරුවරියන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සහ ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණයි. මෙම වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලැබූ අතර 2015 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩසටහන් 280 ක් පවත්වා ඇත. ඒ සඳහා වැය වී ඇති මුදල රු.මි. 2.8 කි.

### IV. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ලියාපදිංචි කිරීමේ වැඩසටහන.

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා (පෙර පාසල් ගුරු පුහුණු) පාඨමාලා ජාතික මට්ටමේ ප්‍රමිතීන්ගෙන් යුක්ත බවට සහතික කොට ළමා ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මේ යටතේ ජාතික මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා 61 ක් ලියාපදිංචි කර ඇති අතර සියළුම ආයතන නියෝජනය වන පරිදි පසුවිපරම් වැඩසටහනක් සිදු කරන ලදී. ඒ සඳහා 2015 වර්ෂය තුළ රු.මි. 0.224 ක් වැය කර ඇත.

## V. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික / ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුව පැවැත්වීම සඳහා රු.මි.0.080 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. ජාතික මට්ටමේ මුල් ළමාවිය සම්බන්ධීකරණ කමිටු 02 ක් පවත්වා ඇති අතර එහි මූල්‍ය ප්‍රගතිය 0.034 කි.

ප්‍රාදේශීය මට්ටමේ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ සම්බන්ධීකරණ කමිටු සඳහා රු.මි. 1.2ක් වෙන්කර ඇති අතර එම මුදල වැයකරමින් දිවයින පුරා කමිටු 602 ක් පවත්වා ඇත.

## VI. ධාරිතා සංවර්ධන වැඩසටහන/ මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම.

මේ යටතේ ළමා ලේකම් කාර්යාලය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව සිටින මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහාත් දැනුම යාවත්කාලීන කිරීම සඳහාත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

2015 වර්ෂයේ හැකියා වර්ධන පුහුණු වැඩසටහන් 09 ක් පැවැත්වීමට සැලසුම් කළ ද වර්ෂය අවසාන වන විට වැඩසටහන් 12 ක් පවත්වා ඇත. පළාත් මට්ටමින් පවත්වන ලද මෙම වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල රු.මි. 2.5 කි. එමගින් රු.මි.1.88 ක් වැය වී ඇත.

ක්ෂේත්‍රය තුළ රාජකාරි කටයුතුවල නිරත වන දිස්ත්‍රික් මුල් ළමාවිය සම්බන්ධීකරණ නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජකාරි කටයුතුවල නිරත මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරීන් සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 135 ක් පවත්වා ඇති අතර ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල රු. මි.0.720 කි. එමගින් වාර්තා වී ඇති මූල්‍ය ප්‍රගතිය රු.මි. 0.24 කි.

## VII. ‘‘ටිකිරි මිතුරු’’ මාධ්‍ය ප්‍රචාරක කටයුතු සහ ප්‍රකාශන

මෙම වැඩසටහන මඟින් සිදු කරනු ලබන්නේ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින් ප්‍රචාරණ වැඩසටහන් සිදු කිරීමත් මුද්‍රිත ප්‍රකාශන/ පොත් යනාදිය පළ කිරීමත් ය. මේ සඳහා රු.මි. 1.029 ක පමණ මුදලක් වැයකරමින් ක්‍රියාවට නංවා ඇත.

## VIII. මුල් ළමාවිය රැකවරණය සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පණතක් බවට පත් කිරීම.

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය දැනට ක්‍රියාත්මක කරමින් පවතින අතර එම ජාතික ප්‍රතිපත්තිය නීතිමය වශයෙන් බලගැන්වීම සඳහා පනතක් බවට පත් කිරීමේ කාර්යය මෙම වසරේ ක්‍රියාවට සඳහා වැය වී ඇති මුදල රු. මි. 0.029 කි.

## IX. මුල් ළමාවිය රැකවරණය පිළිබඳ ජාලය පවත්වා ගැනීම.

මුල් ළමාවිය රැකවරණය පිළිබඳ ජාලය පවත්වා ගැනීම ට අදාළ වන රැස්වීම් වාර තුනක් පවත්වා ඇති අතර ඒ සඳහා වැය වී ඇති මුදල රු.මි 0.02 කි.

## X. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/දිවා සුරැකුම් මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන

පෙර පාසල් සංවර්ධනය කිරීම පිණිස අවශ්‍ය වන ඉගෙනුම් පරිසරය සඳහා අනුග්‍රහය ලබාදීම යටතේ, 2015 වර්ෂයේ දී පෙර පාසල් සඳහා සෙල්ලම් මිදුල් 35 ක් ඉදිකිරීම සඳහා රු.මි.1.75ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර එම මුදලින් පෙර පාසල් / මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සෙල්ලම් මිදුල් 35 ක් ඉදිකර ඇත.

2015 වර්ෂයේ පෙර පාසල්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු.මි. 9.85 ක් වැයකර ඇත. ඒ අනුව මැදවච්චිය , ලුණුගම්වෙහෙර, අඹන්ගඟකෝරළේ, නෙළුව, නාච්චාදූව, යටියන්තොට, බඩල්කුඹුර, කැකිරාව, පෝර්තිවුපත්තු ආදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආශ්‍රිත පෙර පාසල් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කිරීම් සිදු කර ඇත.

## XII. ‘‘අරුණ දකින රටා’’ මුල් ළමාවියේ දරුවන්ගේ සිතුවම් ප්‍රදර්ශනය සහ වැඩමුළුව

මුල් ළමාවියේ දරුවන්ගේ නිර්මාණාත්මක කුසලතාවයන් ඔප් නැංවීම සඳහා වාර්ෂිකව දීප ව්‍යාප්ත මට්ටමින් සිතුවම් ප්‍රදර්ශනයක් පවත්වනු ලබයි. මේ සඳහා දිවයිනේ සෑම පළාතක්ම නියෝජනය වන පරිදි පෙර පාසල් දරු දැරියන්ගේ සිතුවම් ලැබෙන අතර, ඒ අතරින් තෝරාගනු ලබන චිත්‍ර 500කින් යුක්තව මෙම ප්‍රදර්ශනය කොළඹදී පවත්වා අදාළ දරු දැරියන්ට ත්‍යාග සහ සහතික පත් ලබාදීම සිදුකෙරේ. 2015.09.03 වන දින කොළඹ ජාතික කලාභවනේ දී හා ග්‍රීන්පාත් නව නගර ශාලාවේදී අරුණ දකින රටා චිත්‍ර ප්‍රදර්ශනය, ත්‍යාග හා සහතිකපත් ප්‍රදානෝත්සවය සාර්ථකව පවත්වනු ලැබූ අතර මේ සඳහා වැය වී ඇති මුදල රු.මි. 2.0 ක් වේ.

## XIII. මුල් ළමාවිය ආදර්ශ ගම්මාන

දිවයිනේ තෝරාගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල තෝරාගන්නා ලද ග්‍රාම නිලධාරී වසම්වලත් සුදුසු ගම්මාන තෝරා ගෙන එම ගම්මාන‘‘ආදර්ශ මුල් ළමාවිය සංවර්ධන ගම්මාන’’ වශයෙන් වැඩි දියුණු කිරීම කරනු ලැබේ. මෙහිදී එම ගම්මාන ආශ්‍රිතව පිහිටා ඇති පෙර පාසල් අතරින් තෝරාගත් පෙර පාසලක් ආදර්ශ පෙර පාසලක් (මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක්) වශයෙන් සංවර්ධනය කිරීම, අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානය ළමා මිතුරු ස්ථානයක් වශයෙන් වැඩි දියුණු කිරීම සඳහා පොලීසිය තුළ ළමා උද්‍යාන පිහිටුවීම, සෞඛ්‍ය සායන පැවැත්වීම, දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම, පෙර පාසල් වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැනි කාර්යයන් ඉටු කරනු ලබයි.

මෙහිදී එම ගම්මානය ආශ්‍රිත ජනතාව මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දැනුවත්භාවයෙන් සහ සංවේදීතාවයෙන් යුක්ත පිරිසක් බවට පත් කිරීම ද මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණකි. 2015 වර්ෂයේ මෙවැනි ආදර්ශ ගම්මාන 10 ක් පිහිටුවීම සඳහා රු.මි.3 ක් වෙන්කර තිබුණි. එමගින් ආදර්ශ ගම්මාන 07 ක් ක්‍රියාවට නංවා ඇති අතර ඒ සඳහා රු.මි.2.94 ක් වැය වී ඇත.

## XIV. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය

2010 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ආරම්භ කරන ලද විශේෂ වැඩසටහනක් වන මෙම වැඩසටහන සෑම වසරක ම දෙසැම්බර් 14 සිට 20 වැනිදා දක්වා පවත්වනු ලබයි. මේ යටතේ ජාතික සතිය දින 07 තුළදී ම අදාළ විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා වැඩමුළු, අධ්‍යාපන චාරිකා, අත්දැකීම් හුවමාරු වැඩසටහන්, පෙරපාසල් අධ්‍යාපන උපකරණ ලබා දීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ජාතික සතිය තුළදී. විද්‍යුත්, මුද්‍රිත හා වෙනත් මාධ්‍යයන් තුලින් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරයි.

2015 වර්ෂය ආරම්භයේ දී මෙම වැඩසටහන සඳහා රු.මි.5ක් ඇස්තමේන්තු ගත කළ ද වැඩසටහන සඳහා රු.මි. 6.76 ක් පමණ වැය වී ඇත. ඒ අනුව සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි ප්‍රාදේශීය වැඩසටහන් සහ ජාතික වැඩසටහන් 07 ක් පවත්වා ඇත.

## XV. ළමා ලේකම් කාර්යාලය තුළ මුල් ළමාවිය සංවර්ධන සම්පත් මධ්‍යස්ථානයක් ඉදිකිරීම.

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳව වර්තමානයේ දී වැඩිපුර අවධානය යොමු වී ඇති විෂයකි. එබැවින් ඒ පිළිබඳ තොරතුරු රැස් කිරීමට යොමු වන පුද්ගලයන් එම විෂය සම්බන්ධව දැන ගැනීමට මේ සම්බන්ධව කටයුතු කරනු ලබන කේන්ද්‍රීය ආයතනය වන ළමා ලේකම් කාර්යාලයට පැමිණේ. එසේ පැමිණෙන පුද්ගලයන්ගේ ප්‍රයෝජනය සඳහා සම්පත් මධ්‍යස්ථානයක් ළමා ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබයි. මේ සඳහා 2015 වර්ෂයේ දී රු.මි 1.5 ක් වෙන් කර ඇති අතර එම මුදලින් රු.මි. 0.620 ක් වැය වී ඇත.

## XVI. ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දින වැඩසටහන්

ගැහැණු දරුවාගේ ආරක්ෂාව මෙන් ම ගැහැණු දරුවා බල ගැන්වීම සඳහා ආයෝජනය කිරීම සම්බන්ධ තීරණ ගැනීමේ දී ගැහැණු දරුවන්ගේ දායකත්වය ලබා ගැනීම, ගැහැණු දරුවාට එරෙහි හිංසනය මැඩලීම, ගැහැණු දරුවාගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ඔවුන්ට යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා අවස්ථා සලසා දීම , ඔක්තෝම්බර් 11 දිනට යෙදෙන ජාත්‍යන්තර ගැහැණු දරුවාගේ දිනය සැමරීමේ මූලික අරමුණු වේ. ඒ අනුව දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් 25 ක් පවත්වන ලද අතර ඒ සඳහා වැය වූ මුදල රු.මි. 0.5 කි.

## XVII. හදිසි අවස්ථාවක දී මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ වැඩසටහන.

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳව මුලින් සැලසුම්කර නොමැති අවශ්‍යතා සඳහා ඒ ඒ අවස්ථාවන්වලදී ඉල්ලීම් අනුව කටයුතු කරන ලදී. මේ සඳහා වෙන් කරන ලද මුදල රු.මි 0.4 ක් වූ අතර එම මුදල ම 2015 වර්ෂය අවසන් වන විට වැය වී ඇත.

## XVIII. පරිපාලන වියදම්

ළමා ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කරනු ලබන විවිධාකාරයේ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ වැඩසටහන් අධීක්ෂණ කටයුතු සඳහා 2015 වසරේ ක්‍රියාකාරී සැලැස්ම තුළ රු.මි 0.040 ක් වෙන්කර තිබූ අතර වෙන් කර තිබූ එම මුදල ම 2015 වර්ෂය අවසාන වන විට වැය වී ඇත.

*මුල් ළමාවිය සංවර්ධන ජාතික සතිය*





